ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක : 2477424, 2477423, 2477418
ෆැක්ස් : 2346257, 2477739
ඊ-මේල් : dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව |
| දිනය | 2020 ජනවාරි මස 17 දින |

## විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වය - 2019 නොවැම්බර්

### සමස්ත නිරීක්ෂණ

ආනයන සහ අපනයන අඩු වීම සමඟ 2019 නොවැම්බර් මාසයේදී වෙළඳ හිඟය පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සුළු වශයෙන් අඩු විය. ආනයන වියදම සැලකිය යුතු ලෙස අඩු වීම හා අපනයන ආදායම සුළු වශයෙන් වැඩි වීම හේතුවෙන් 2019 වසරේ පළමු මාස එකොළහ තුළදී වෙළඳ හිඟය 2018 වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව අඩු විය. පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව 2019 වසරේ නොවැම්බර් මාසයේදී සංචාරක පැමිණීම්වල පහළ යෑමක් වාර්තා වුවද, සංචාරක කර්මාන්තය අඛණ්ඩව යථා තත්ත්වයට පත් වෙමින් පවතී. 2019 වසරේ නොවැම්බර් මාසයේදී විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ, පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව අඩු වූ අතර, 2019 වසරේ පළමු මාස එකොළහ තුළදී සමුච්චිත පදනම මතද අඩු වීමක් වාර්තා කළේය. මේ අතර, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ (ජ.මූ.අරමුදලේ) විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහනෙහි හත්වන වාරිකය ලැබීමත්, රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ වෙත විදේශීය ශුද්ධ ලැබීම් වාර්තා වීමත් සමඟ ගෙවුම් තුලනයෙහි මූල්‍ය ගිණුම ශක්තිමත් විය. කෙසේ වෙතත්, මෙම මාසය තුළදී කොළඹ කොටස් වෙළඳපොළ වෙතින් ශුද්ධ ගෙවීමක් වාර්තා විය. 2019 වසරේදී සහ 2020 වසරේ මේ දක්වා කාලපරිච්ඡේදය තුළදී ශ්‍රී ලංකා රුපියල එ.ජ. ඩොලරයට සාපේක්ෂව අතිප්‍රමාණය විය.




ශ්‍රී ලංකා මහ බැංකුව විසින් වෙළඳ භාණ්ඩ ක්‍රියාකාරිත්වය පිළිබඳව වැඩිදුර තොරතුරු ඇතුළත් 'මාසික වෙළඳ විවරණිකාව' ප්‍රකාශයට පත් කරනු ලබන අතර එය ශ්‍රී ලංකා මහ බැංකුවේ වෙබ් අඩවියෙන් ලබා ගත හැක. සංඛ්‍යාති > ආර්ථික දර්ශක > මාසික වෙළඳ විවරණිකාව https://www.cbsl.gov.lk/si/node/6181

**සංඛ්‍යා සටහන 1: විදේශීය අංශයේ ක්‍රියාකාරීත්වයෙහි සාරාංශය (අ)**

| කාණ්ඩය | 2018 නොවැ. එ.ජ.ඩො. මිලියන | 2019 නොවැ. එ.ජ.ඩො. මිලියන | වෙනස (%) | 2018 ජන.- නොවැ. එ.ජ.ඩො. මිලියන | 2019 ජන.- නොවැ. එ.ජ.ඩො. මිලියන | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| අපනයන | 980 | 979 | -0.1 | 10,856 | 10,939 | 0.8 |
| ආනයන | 1,765 | 1,741 | -1.3 | 20,498 | 18,153 | -11.4 |
| වෙළඳ ශේෂය (ශුද්ධ) | -785 | -762 | | -9,642 | -7,214 | |
| සංචාරක ඉපැයීම් | 367 (ආ) | 332 (ඇ) | -9.5 | 3,905 (ආ) | 3,138 (ඇ) | -19.6 |
| විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ | 555 | 515 | -7.2 | 6,431 | 6,052 | -5.9 |
| කොළඹ කොටස් වෙළඳපොළ වෙත වූ ලැබීම් (ශුද්ධ) (ඈ) | -30 | -36 | | -29 | -30 | |
| රාජ්‍ය අංශයේ ලැබීම් (දළ) | 86 | 190 | | 5,490 | 6,451 | |
| භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කර | - | 69 | | 698 | 580 | |
| දිගුකාලීන ණය | 86 | 121 | | 2,292 | 1,471 | |
| ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර | - | - | | 2,500 | 4,400 | |
| ජා.මූ. අරමුදල - විස්තීර්ණ ණය පහසුකම | - | 164 | | 252 | 328 | |
| විදේශ සෘජු ආයෝජන (ඉ) | | | | 1,652 | 772 | |
| සමස්ත ශේෂය | | | | -807 | 488 | |

මූලයන්: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, කොළඹ කොටස් වෙළඳපොළ, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

(අ) තාවකාලික
(ආ) ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් 2018 වර්ෂය සඳහා සිදු කළ සමීක්ෂණයට අනුව ඇස්තමේන්තු කළ සංචාරකයකු මෙරට ගත කරන සාමාන්‍ය කාලය සහ සංචාරකයකුගේ සාමාන්‍ය දෛනික වියදමට අනුව සංශෝධිතය.
(ඇ) ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් 2019 වර්ෂය සඳහා එහි සමීක්ෂණ ප්‍රතිඵල නිකුත් කිරීමෙන් පසු මෙම තාවකාලික ඇස්තමේන්තු සංශෝධනය විය හැකිය.
(ඈ) ද්විතීයික සහ ප්‍රාථමික වෙළඳපොළ ගනුදෙනු ඇතුළත් වේ.
(ඉ) සෑම කාලපරිච්ඡේදයක් සඳහාම දත්ත පවතිනුයේ පළමු මාස නවය සඳහා වන අතර, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් වාර්තා කළ පරිදි සෘජු ආයෝජන සමාගම් වෙත වූ විදේශීය ණය සහ කොටස් වෙළෙඳපොළ වෙත වූ ශුද්ධ සෘජු ආයෝජන ඇතුළත් වේ.

## වෙළඳ හිඟය හා වෙළඳ මිල අනුපාතය

- 2019 වසරේ නොවැම්බර් මාසයේදී **වෙළඳ ගිණුමේ හිඟය** 2018 වසරේ නොවැම්බර් මාසයේදී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 785 සිට එ.ජ. ඩොලර් මිලියන 762 ක් දක්වා සුළු වශයෙන් අඩු විය. සමුච්චිත වශයෙන් සැලකූ විට, 2019 වසරේ පළමු මාස එකොළහ තුළදී වෙළඳ හිඟය 2018 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේදී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 9,642 හා සැසඳීමේදී එ.ජ. ඩොලර් මිලියන 7,214 ක් දක්වා එ.ජ. ඩොලර් මිලියන 2,428 කින් අඩු විය. වෙළඳ හිඟය අඩු වීම සඳහා ප්‍රධාන වශයෙන් දායක වූ අයිතම රූපසටහන 1 මගින් දැක්වේ.
- මේ අතර, 2019 වසරේ නොවැම්බර් මාසයේදී අපනයන මිල ගණන්වලට සාපේක්ෂව ආනයන මිල ගණන් අතර අනුපාතය දැක්වෙන **වෙළඳ මිල අනුපාතය** පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සියයට 9.0 කින් සැලකිය යුතු ලෙස පහළ ගිය අතර, ඒ සඳහා ආනයන මිල ගණන් පහළ යෑමේ වේගයට වඩා වැඩි වේගයකින් අපනයන මිල ගණන් පහළ යෑම හේතු විය. සමුච්චිත වශයෙන් සැලකූ විට, 2019 වසරේ පළමු මාස එකොළහ තුළදී වෙළඳ මිල අනුපාතය 2018 වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 1.6 කින් පහත වැටුණි.

**රූප සටහන 1: වෙළඳ හිඟය අඩු වීම සඳහා දායක වූ ප්‍රධාන අයිතම : 2019 ජනවාරි - නොවැම්බර් (එ.ජ. ඩොලර් මිලියන)**




මූලයන්: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 2: මාසික වෙළඳ හිඟය (2018 – 2019)**




මූලයන්: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 3: වෙළඳ මිල අනුපාතය (2018 – 2019)**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

## වෙළඳ භාණ්ඩ අපනයන ක්‍රියාකාරිත්වය

- 2018 වසරේ නොවැම්බර් මාසයට සාපේක්ෂව සියලුම ප්‍රධාන උප කාණ්ඩවල බොහෝදුරට සමාන ප්‍රවණතා වාර්තාවීමත් සමඟ 2019 වසරේ නොවැම්බර් මාසයේදී **වෙළඳ භාණ්ඩ අපනයන** ආදායම එ.ජ. ඩොලර් මිලියන 979 ක් දක්වා සියයට 0.1 කින් සුළු වශයෙන් පහත වැටුණි.
- උප කාණ්ඩවල මිශ්‍ර ක්‍රියාකාරිත්වයක් පිළිබිඹු කරමින් 2019 වසරේ නොවැම්බර් මාසයේදී **කෘෂිකාර්මික අපනයන** ආදායම පහත වැටුණි. තේ අපනයන පරිමාව අඛණ්ඩව ඉහළ ගියද ජාත්‍යන්තර වෙළඳපොළෙහි තේ මිල ගණන් පහළ යෑමත් සමඟ අපනයන මිල ගණන්වල සාමාන්‍යය අඩු වීම හේතුවෙන් පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව තේ

අපනයන ආදායම පහත වැටුණි. මීට අමතරව, ප්‍රධාන වශයෙන් කුරුඳු අපනයන මිල ගණන් අඩු වීම සහ කරාබුනැටි හා ගම්මිරිස් අපනයන පරිමාවන් අඩුවීම හේතුවෙන් 2019 වසරේ නොවැම්බර් මාසයේදී කුළුබඩු අපනයන ආදායම පහත වැටුණි. ඇමෙරිකා එක්සත් ජනපදය වෙතින් වූ ඉල්ලුම පහළ යෑම හේතුවෙන් මුහුදු ආහාර අපනයන ආදායම ද පහත වැටුණි. මෙයට වෙනස්ව යමින්, ප්‍රධාන වශයෙන් පලතුරු, පුවක් සහ බුලත් වැනි සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත අපනයන ආදායම ඉහළ ගිය අතර, පොල් අපනයන පරිමාව ඉහළ යෑම හේතුවෙන් පොල් අපනයන ආදායම ඉහළ ගියේය.

- 2018 වසරේ නොවැම්බර් මාසයට සාපේක්ෂව 2019 නොවැම්බර් මාසයේදී **කාර්මික අපනයන** ආදායම බොහෝදුරට නොවෙනස්ව පැවතුණි. ටයර් අපනයන පහත වැටීම හේතුවෙන් රබර් නිෂ්පාදිත අපනයන ආදායම අඩු වූ අතර, සියලුම උප කාණ්ඩවල අඩු ක්‍රියාකාරිත්වය හේතුවෙන් යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ අපනයන ආදායම පහත වැටුණි. මේ අතර, ප්‍රධාන වශයෙන් ජාත්‍යන්තර වෙළඳපොළෙහි බොරතෙල් මිල ගණන් පහත වැටීමත් සමඟ නැව් සඳහා යොදාගනු ලබන ඉන්ධන මිල ගණන් පහත වැටීමෙන් නැව් හා ගුවන් යානා සඳහා යොදාගනු ලබන ඉන්ධන අපනයන ආදායම තවදුරටත් පහත වැටුණු අතර, එමඟින් ඛනිජ තෙල් නිෂ්පාදිත අපනයන ආදායම පහත වැටුණි. කෙසේ වුවද, ඛනිජ තෙල් නිෂ්පාදිත අපනයනය පහත වැටීම නැප්තා සහ දැවි තෙල් අපනයන ඉහළ යෑම මගින් බොහෝදුරට මග හැරී ගොස් ඇත. මෙයට වෙනස්ව යමින්, යුරෝපා සංගමය සහ සාම්ප්‍රදායික නොවන වෙළඳපොළ වෙතින් වූ ඉල්ලුම ඉහළ යෑම හේතුවෙන් 2019 වසරේ නොවැම්බර් මාසයේදී රෙදිපිළි හා ඇඟලුම් අපනයන ආදායම ඉහළ ගියේය. මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ යටතේ වර්ග කර ඇති සියලුම කාණ්ඩවල අපනයන පරිමාව ඉහළ යෑම හේතුවෙන් එම කාණ්ඩයේ අපනයන ආදායම ඉහළ ගියේය.
- සමස්ත අපනයනවලින් සියයට 0.3 ක් පමණක් වන **ඛනිජ අපනයන** ආදායම 2019 වසරේ නොවැම්බර් මාසයේදී පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව ඉහළ ගිය අතර, ඒ සඳහා යපස්, යබොර සහ අළු අපනයන ඉහළ යෑම හේතු විය.
- 2019 වසරේ නොවැම්බර් මාසයේදී අපනයන පරිමා දර්ශකය පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සියයට 11.6 කින් ඉහළ ගිය අතර, අපනයන මිල දර්ශකය සියයට 10.5 කින් පහත වැටුණි. මෙමගින් 2018 නොවැම්බර් මාසයට සාපේක්ෂව මෙම මාසයේදී අපනයන ආදායම පහත වැටීම සඳහා අපනයන මිල ගණන් පහත වැටීම මුළුමනින්ම හේතු වූ බව පිළිබිඹු වේ.

**රූප සටහන 4: මාසික අපනයන ක්‍රියාකාරිත්වය**




මූලයන්: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 5: අපනයන පරිමා දර්ශකය**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**සංඛ්‍යා සටහන 2: වෙළඳ භාණ්ඩ අපනයන ආදායම (අ)**

| කාණ්ඩය | 2018 නොවැ. (එ.ජ. ඩොලර් මිලියන) | 2019 නොවැ. (එ.ජ. ඩොලර් මිලියන ) | වෙනස (%) | 2018 ජන.- නොවැ. (එ.ජ. ඩොලර් මිලියන) | 2019 ජන.- නොවැ. (එ.ජ. ඩොලර් මිලියන) | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **1. කාර්මික අපනයන** | **787.9** | **787.6** | **…** | **8,444.9** | **8,626.6** | **2.2** |
| ආහාර, පාන වර්ග හා දුම්කොළ | 33.9 | 34.9 | 3.0 | 423.8 | 410.9 | (3.0) |
| සත්ත්ව ආහාර | 8.5 | 8.3 | (2.6) | 99.6 | 117.4 | 17.8 |
| රෙදිපිළි හා ඇඟලුම් | 469.8 | 484.8 | 3.2 | 4,824.3 | 5,113.2 | 6.0 |
| එයින් ඇඟලුම් | 438.5 | 448.1 | 2.2 | 4,501.2 | 4,753.7 | 5.6 |
| රෙදිපිළි | 22.5 | 25.7 | 14.0 | 235.9 | 261.5 | 10.9 |
| වෙනත් රෙදිපිළි සැකසුම් | 8.8 | 11.1 | 26.3 | 87.2 | 98.1 | 12.5 |
| රබර් නිෂ්පාදිත | 71.3 | 60.6 | (15.0) | 798.9 | 793.1 | (0.7) |
| මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ | 20.3 | 26.9 | 32.1 | 259.1 | 281.4 | 8.6 |
| යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ | 37.4 | 28.9 | (22.8) | 401.6 | 370.3 | (7.8) |
| ප්‍රවාහන උපකරණ | 6.4 | 4.5 | (30.5) | 111.9 | 139.7 | 24.9 |
| ඛනිජ තෙල් නිෂ්පාදිත | 56.9 | 56.5 | (0.7) | 569.2 | 465.0 | (18.3) |
| රසායනික නිෂ්පාදිත | 12.0 | 14.8 | 23.8 | 153.6 | 163.5 | 6.5 |
| දැව හා කඩදාසි නිෂ්පාදිත | 11.9 | 8.4 | (29.5) | 128.8 | 120.1 | (6.7) |
| මුද්‍රණ කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත | 4.4 | 6.0 | 35.5 | 29.3 | 44.5 | 52.1 |
| සම්භාණ්ඩ, සංචාරක භාණ්ඩ හා පාවහන් | 10.8 | 6.2 | (42.4) | 139.0 | 95.4 | (31.4) |
| ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 6.4 | 6.4 | 0.9 | 70.3 | 67.7 | (3.6) |
| මූල ලෝහ හා උපාංග | 14.6 | 14.5 | (0.7) | 153.1 | 163.1 | 6.6 |
| පිඟන් මැටි නිෂ්පාදිත | 2.6 | 2.7 | 6.6 | 29.3 | 27.7 | (5.4) |
| වෙනත් | 20.7 | 23.2 | 11.7 | 253.3 | 253.5 | 0.1 |
| **2. කෘෂිකාර්මික අපනයන** | **187.8** | **187.3** | **(0.2)** | **2,362.7** | **2,266.5** | **(4.1)** |
| තේ | 103.2 | 101.5 | (1.7) | 1,311.4 | 1,240.6 | (5.4) |
| රබර් | 2.2 | 1.1 | (48.2) | 29.7 | 22.4 | (24.6) |
| පොල් | 20.5 | 22.9 | 11.9 | 287.1 | 307.7 | 7.2 |
| කුළුබඩු | 27.7 | 24.1 | (13.1) | 330.3 | 291.5 | (11.7) |
| එළවළු | 2.1 | 2.3 | 6.2 | 26.1 | 29.2 | 12.1 |
| සකස් නොකළ දුම්කොළ | 2.3 | 3.1 | 37.8 | 31.5 | 31.1 | (1.3) |
| සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත | 7.6 | 13.3 | 76.7 | 110.0 | 105.5 | (4.2) |
| මුහුදු ආහාර | 22.3 | 19.0 | (14.6) | 236.6 | 238.6 | 0.8 |
| **3. ඛනිජ අපනයන** | **2.4** | **2.4** | **3.0** | **32.4** | **30.6** | **(5.6)** |
| **4. වර්ග නොකළ අපනයන** | **1.5** | **1.4** | **(7.1)** | **16.2** | **15.6** | **(3.9)** |
| **මුළු අපනයන** | **979.6** | **978.8** | **(0.1)** | **10,856.3** | **10,939.2** | **0.8** |

(අ) තාවකාලික

මූලයන්: ශ්‍රී ලංකා රේගුව, ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සහ අනෙකුත් ඛනිජ තෙල් අපනයනකරුවන්, ශ්‍රී ලංකා මහ බැංකුව

… සැලකිය යුතු නොවේ.

## වෙළඳ භාණ්ඩ ආනයන ක්‍රියාකාරිත්වය

- අන්තර් භාණ්ඩ ආනයනය පහත වැටීම හේතුවෙන් 2019 වසරේ නොවැම්බර් මාසයේ **වෙළඳ භාණ්ඩ ආනයන** වියදම පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සියයට 1.3 ක සාමාන්‍ය ප්‍රමාණයකින් එ.ජ.ඩොලර් මිලියන 1,741 ක් දක්වා පහත වැටුණ අතර, එය අඛණ්ඩව 13 වන මාසයටත් ආනයන වියදම අඩු වීමකි.
- පෞද්ගලික රථවාහන ආනයන අඩුවීම හේතුවෙන් 2019 නොවැම්බර් මාසයේදී ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ ආනයනය අඛණ්ඩව පහත වැටුණ ද පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව එළවළු (ප්‍රධාන වශයෙන් ළූණු), සීනි සහ කිරි නිෂ්පාදිත ආනයන පරිමා සහ මිල ගණන් ඉහළ යෑමත් සමඟ ආහාර හා පාන වර්ග ආනයනය වර්ධනය වීම නිසා **පාරිභෝගික භාණ්ඩ** ආනයන වියදම ඉහළ ගියේය. කෙසේ වුවද, ප්‍රධාන වශයෙන් සහනදායී බලපත්‍ර මගින් රථවාහන ආනයනය කිරීමේ බලපෑම පිළිබිඹු කරමින් පෞද්ගලික රථවාහන ආනයන වියදම 2019 වසරේ පළමු භාගයේදී වාර්තා කළ අගයන්ට සාපේක්ෂව ජූලි මාසයේ සිට සාමාන්‍යයෙන් ඉහළ මට්ටමක පැවතුණි.
- බොරතෙල්, පිරිපහදු කළ ඛනිජ තෙල් සහ ගල් අඟුරු යන සියලුම උප කාණ්ඩවල ආනයන පරිමාව සහ ජාත්‍යන්තර වෙළඳපොළෙහි මිල ගණන් අඩු වීම හේතුවෙන් ඉන්ධන ආනයන වියදම අඩු වීම, 2019 වසරේ නොවැම්බර් මාසයේදී **අන්තර් භාණ්ඩ** ආනයන වියදම පහත වැටීම සඳහා ප්‍රධාන වශයෙන් හේතුවිය. මීට අමතරව, 2018 වසරේ නොවැම්බර් මාසයේදී යකඩ හා වානේ විශාල වශයෙන් ආනයනය කිරීමේ පදනම් බලපෑම හේතුවෙන් මෙම මාසයේදී මූල ලෝහ ආනයන වියදම පහත වැටුණි. කෙසේ වුවද, ප්‍රධාන වශයෙන් තිරිඟු හා ඉරිඟු ආනයන පරිමාව ඉහළ යෑම හේතුවෙන් ඒ සඳහා වූ ආනයන වියදම ඉහළ ගිය අතර, රෙදි වර්ග හා නූල් ආනයන ඉහළ යෑම හේතුවෙන් රෙදිපිළි හා රෙදිපිළි උපාංග ආනයන වියදම ඉහළ ගියේය. මීට අමතරව, 2019 වසරේ නොවැම්බර් මාසයේදී ඛනිජ නිෂ්පාදිත යටතේ වර්ග කර ඇති සිමෙන්ති ක්ලින්කර ආනයන වියදම සැලකිය යුතු ලෙස ඉහළ ගියේය.
- මේ අතර, සියලුම උප කාණ්ඩවල ආනයන වියදම ඉහළ යෑම හේතුවෙන් 2019 වසරේ නොවැම්බර් මාසයේදී **ආයෝජන භාණ්ඩ** ආනයන වියදම ඉහළ ගියේය. මේ අනුව, වෛද්‍ය හා රසායනාගාර උපකරණ ආනයනය ඉහළ යෑම හේතුවෙන් යන්ත්‍රසූත්‍ර හා උපකරණ ආනයනය වියදම ඉහළ ගිය අතර, දුම්රිය එන්ජින් හා දුම්රිය මැදිරි ආනයනය සඳහා වූ වියදම ඉහළ යෑම හේතුවෙන් ප්‍රවාහන උපකරණ ආනයන වියදම ඉහළ ගියේය. මීට අමතරව, පාලම් හා පාලම් කොටස් සඳහා වන යකඩ හා වානේ උපාංග ආනයනය ඉහළ යෑම හේතුවෙන් ගොඩනැගිලි ද්‍රව්‍ය ආනයන වියදම ඉහළ ගියේය.
- 2019 නොවැම්බර් මාසයේදී ආනයන පරිමා දර්ශකය සියයට 0.3 කින් ඉහළ ගිය අතර, ආනයන මිල දර්ශකය සියයට 1.7 කින් පහත වැටුණි. මේ අනුව, 2018 වසරේ නොවැම්බර් මාසයට සාපේක්ෂව ආනයන වියදම අඩු වීම සඳහා ආනයන මිල ගණන් පහත වැටීම මුළුමනින්ම හේතු වූ බව පිළිබිඹු වේ.

**රූප සටහන 6: මාසික ආනයන ක්‍රියාකාරිත්වය**




මූලය: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 7: ආනයන පරිමා දර්ශකය**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**සංඛ්‍යා සටහන 3: වෙළඳ භාණ්ඩ ආනයන වියදම (අ)**

| කාණ්ඩය | 2018 නොවැ. (එ.ජ. ඩොලර් මිලියන) | 2019 නොවැ. (එ.ජ. ඩොලර් මිලියන) | වෙනස (%) | 2018 ජන.- නොවැ. (එ.ජ. ඩොලර් මිලියන) | 2019 ජන.- නොවැ. (එ.ජ. ඩොලර් මිලියන) | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **1. පාරිභෝගික භාණ්ඩ** | **363.5** | **370.4** | **1.9** | **4,622.7** | **3,565.7** | **(22.9)** |
| ආහාර හා පාන වර්ග | 111.0 | 140.7 | 26.7 | 1,471.4 | 1,278.9 | (13.1) |
| ධාන්‍ය හා ඇඹරුම් කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත | 3.2 | 3.3 | 2.1 | 121.2 | 32.1 | (73.5) |
| එයින් සහල් | 1.4 | 0.8 | (-39.7) | 103.9 | 10.9 | (89.5) |
| කිරි නිෂ්පාදිත | 25.4 | 31.6 | 24.2 | 299.0 | 282.0 | (5.7) |
| එළවළු | 21.8 | 32.2 | 48.1 | 277.9 | 269.5 | (3.0) |
| මුහුදු ආහාර | 15.9 | 20.3 | 27.7 | 182.4 | 199.3 | 9.2 |
| සීනි හා රසකැවිලි | 13.4 | 19.8 | 47.9 | 223.4 | 179.9 | (19.5) |
| කුළුබඩු | 8.6 | 12.1 | 41.3 | 104.1 | 102.2 | (1.9) |
| පාන වර්ග | 7.3 | 7.5 | 2.5 | 81.1 | 75.0 | (7.5) |
| වෙනත් ආහාර හා පාන වර්ග | 15.6 | 14.0 | (10.0) | 182.2 | 138.9 | (23.8) |
| ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ | 252.5 | 229.7 | (9.0) | 3,151.2 | 2,286.8 | (27.4) |
| පෞද්ගලික රථවාහන | 104.9 | 80.7 | (23.1) | 1,496.2 | 731.7 | (51.1) |
| බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත | 46.5 | 44.4 | (4.5) | 488.6 | 498.0 | 1.9 |
| රෙදිපිළි හා උපාංග | 23.2 | 20.5 | (11.6) | 283.4 | 251.1 | (11.4) |
| ගෘහ උපකරණ | 16.8 | 21.7 | 29.2 | 216.0 | 187.4 | (13.2) |
| විදුලි සංදේශ මෙවලම් | 24.1 | 26.2 | 8.6 | 250.9 | 225.6 | (10.1) |
| ගෘහ හා දැව භාණ්ඩ | 12.8 | 14.8 | 15.8 | 156.4 | 155.2 | (0.8) |
| වෙනත් ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ | 24.2 | 21.4 | (11.7) | 259.7 | 237.8 | (8.4) |
| **2. අන්තර් භාණ්ඩ** | **1,074.6** | **992.5** | **(7.6)** | **11,504.9** | **10,413.2** | **(9.5)** |
| ඉන්ධන | 403.6 | 319.6 | (20.8) | 3,834.6 | 3,558.4 | (7.2) |
| එයින් බොරතෙල් | 110.7 | 96.1 | (13.2) | 886.7 | 920.4 | 3.8 |
| පිරිපහදු කළ ඛනිජතෙල් | 245.6 | 202.2 | (17.7) | 2,750.2 | 2,447.5 | (11.0) |
| ගල් අඟුරු | 47.2 | 21.3 | (54.8) | 197.6 | 190.5 | (3.6) |
| දියමන්ති, අගනා ගල් හා ලෝහ වර්ග | 9.9 | 19.4 | 97.1 | 552.7 | 177.5 | (67.9) |
| එයින් රත්‍රන් | 0.1 | 0.1 | ... | 438.7 | 2.4 | (99.4) |
| රෙදිපිළි හා රෙදිපිළි උපාංග | 245.7 | 256.9 | 4.5 | 2,617.0 | 2,661.1 | 1.7 |
| රසායනික නිෂ්පාදිත | 73.2 | 66.2 | (9.6) | 834.3 | 764.4 | (8.4) |
| ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 60.2 | 52.6 | (12.6) | 645.9 | 558.7 | (13.5) |
| කඩදාසි හා ඝන කඩදාසි හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 45.4 | 37.0 | (18.5) | 486.8 | 419.7 | (13.8) |
| මූල ලෝහ | 77.0 | 34.3 | (55.4) | 596.8 | 512.1 | (14.2) |
| පොහොර | 24.6 | 9.1 | (63.0) | 235.6 | 204.0 | (13.4) |
| තිරිඟු හා ඉරිඟු | 22.0 | 59.5 | 169.7 | 348.6 | 326.3 | (6.4) |
| ආහාර සැකසුම් | 21.0 | 20.7 | (1.1) | 275.1 | 210.9 | (23.3) |
| කෘෂිකාර්මික යෙදවුම් | 18.8 | 12.9 | (31.1) | 189.7 | 168.5 | (11.1) |
| ඛනිජ නිෂ්පාදිත | 12.8 | 45.7 | 256.0 | 171.0 | 231.1 | 35.1 |
| වෙනත් අන්තර් භාණ්ඩ | 60.4 | 58.5 | (3.1) | 716.8 | 620.3 | (13.5) |
| **3. ආයෝජන භාණ්ඩ** | **326.0** | **377.8** | **15.9** | **4,296.4** | **4,167.1** | **(3.0)** |
| යන්ත්‍රසූත්‍ර හා උපකරණ | 179.5 | 216.2 | 20.5 | 2,291.6 | 2,251.1 | (1.8) |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | 103.9 | 114.5 | 10.3 | 1,383.2 | 1,391.7 | 0.6 |
| ප්‍රවාහන උපකරණ | 42.1 | 46.5 | 10.3 | 615.9 | 518.4 | (15.8) |
| වෙනත් ආයෝජන භාණ්ඩ | 0.5 | 0.6 | 7.5 | 5.6 | 5.9 | 4.1 |
| **4. වර්ග නොකළ ආනයන** | **0.5** | **0.4** | **(17.7)** | **74.2** | **6.8** | **(90.8)** |
| **මුළු ආනයන** | **1,764.6** | **1,741.1** | **(1.3)** | **20,498.1** | **18,152.9** | **(11.4)** |

(අ) තාවකාලික

මූලයන්: ශ්‍රී ලංකා රේගුව, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, ලංකා අයි.ඕ.සී. සමාගම, ශ්‍රී ලංකා මහ බැංකුව

... සැලකිය යුතු නොවේ.

## ජංගම ගිණුම වෙත වාර්තා වූ අනෙකුත් ප්‍රධාන ලැබීම්

- පාස්කු ඉරු දින සිදු වූ ප්‍රහාරවලින් බලපෑමට ලක්වූ **සංචාරක පැමිණීම්** ප්‍රමාණය මාසිකව ක්‍රමයෙන් යථා තත්ත්වයට පත්විය. 2019 වසරේ නොවැම්බර් මාසයේ වාර්තා වූ සංචාරක පැමිණීම් ප්‍රමාණය 176,984 ක් වූ අතර, එය 2019 වසරේ ඔක්තෝබර් මාසයේ වාර්තා වූ සියයට 22.5 ක අඩු වීම සහ සැප්තැම්බර් මාසයේදී වාර්තා වූ සියයට 27.2 ක අඩුවීමට සාපේක්ෂව සියයට 9.5 ක අඩු වීමකි. සංචාරක පැමිණීම්හි මෙම අඩුවීම සඳහා ඕස්ට්‍රේලියාව, ප්‍රංශය, ඉන්දියාව සහ එක්සත් රාජධානිය වැනි ප්‍රධාන රටවල්වලින් පැමිණි සංචාරකයින් ගණන අඩු වීම මූලිකවම හේතු විය. මේ අතර, 2019 වසරේ නොවැම්බර් මාසයේදී රුසියාවෙන් හා යුක්රේනයෙන් පැමිණි සංචාරකයින් ප්‍රමාණය පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව ඉහළ ගියේය. 2019 වසරේ පළමු මාස එකොළහ තුළදී පැමිණි මුළු සංචාරකයින් ප්‍රමාණය 1,672,039 ක් වූ අතර, එය 2018 වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 19.6 ක අඩු වීමකි.
- 2019 වසරේ නොවැම්බර් මාසයේදී **සංචාරක ඉපැයීම්**, 2018 නොවැම්බර් මාසයේදී වූ එ.ජ. ඩොලර් මිලියන 367 ට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 332 ක් වනු ඇතැයි තාවකාලිකව ඇස්තමේන්තු කර ඇත. 2019 වසරේ පළමු මාස එකොළහ තුළදී සමුච්චිත පදනම මත වූ සංචාරක ඉපැයීම්, 2018 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේදී වූ එ.ජ. ඩොලර් මිලියන 3,905 ට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 3,138 ක් වනු ඇතැයි තාවකාලිකව ඇස්තමේන්තු කර ඇත.
- මේ අතර, 2019 නොවැම්බර් මාසයේදී, **විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ** එ.ජ. ඩොලර් මිලියන 515 ක් දක්වා පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සියයට 7.2 කින් අඩු විය. 2019 වසරේ පළමු මාස එකොළහ තුළදී සමුච්චිත පදනම මත වූ විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ 2018 වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 6,052 ක් දක්වා සියයට 5.9 කින් අඩු විය.

**රූප සටහන 8: සංචාරක පැමිණීම්හි ප්‍රධාන මූලාශ්‍ර**




මූලය: ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

**රූප සටහන 9: සංචාරක ඉපැයීම් සහ විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ**




මූලයන්: ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, බලපත්‍රලාභී බැංකු, ශ්‍රී ලංකා මහ බැංකුව

## මූල්‍ය ලැබීම්

- 2019 වසරේ නොවැම්බර් මාසයේදී ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම යටතේ හත්වන වාරිකය ලෙස එ.ජ. ඩොලර් මිලියන 164 ක් ශ්‍රී ලංකාවට ලැබුණි. මෙම නවතම ණය වාරිකය ලැබීමත් සමඟ, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම යටතේ ලද මුළු ලැබීම් ප්‍රමාණය එ.ජ. ඩොලර් බිලියන 1.31 ක් විය.
- 2019 වසරේ නොවැම්බර් මාසයේදී රුපියල්වලින් නාමනය කරන ලද රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ වෙත වූ විදේශීය ආයෝජන එ.ජ. ඩොලර් මිලියන 46 ක ශුද්ධ ලැබීමක් වාර්තා කළේය. සමුච්චිත පදනම මත, වසරේ පළමු මාස එකොළහ තුළදී රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ වෙතින් එ.ජ. ඩොලර් මිලියන 234 ක ශුද්ධ ගෙවීමක් වාර්තා විය.
- ප්‍රාථමික හා ද්විතීයික වෙළඳපොළ ගනුදෙනු ඇතුළුව කොළඹ කොටස් වෙළඳපොළෙහි විදේශීය ආයෝජන, 2019 වසරේ නොවැම්බර් මාසයේදී එ.ජ. ඩොලර් මිලියන 36 ක ශුද්ධ ගෙවීමක් වාර්තා කළේය. සමුච්චිත පදනම මත, 2019 වසරේ පළමු මාස එකොළහ තුළදී කොළඹ කොටස් වෙළඳපොළ වෙතින් එ.ජ. ඩොලර් මිලියන 30 ක ශුද්ධ ගෙවීමක් වාර්තා විය.
- තවද, 2019 නොවැම්බර් මාසයේදී රජය වෙත වූ දිගුකාලීන ණය, එ.ජ. ඩොලර් මිලියන 30 ක ශුද්ධ ලැබීමක් වාර්තා කළේය.

## ජාත්‍යන්තර සංචිත

- 2019 වසරේ නොවැම්බර් මස අවසානය වන විට දළ නිළ සංචිත එ.ජ. ඩොලර් බිලියන 7.5 ක් වූ අතර, එය ආනයනික මාස 4.5 කට සමාන විය. මේ අතර, දළ නිල සංචිත හා බැංකු අංශයේ විදේශීය වත්කම්වලින් සමන්විත මුළු විදේශීය වත්කම් ප්‍රමාණය, 2019 නොවැම්බර් මස අවසානය වන විට එ.ජ. ඩොලර් බිලියන 10.2 ක් වූ අතර, එය ආනයනික මාස 6.2  කට සමාන විය.

**රූප සටහන 10: දළ නිල සංචිත සහ සංචිත ප්‍රමාණාත්මකභාවය**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

## විනිමය අනුපාතිකයේ හැසිරීම

- 2019 වසරේ නොවැම්බර් අවසානය දක්වා වූ කාලපරිච්ඡේදය තුළදී ශ්‍රී ලංකා රුපියල අතිප්‍රමාණය විය. 2019 වසරේ දෙසැම්බර් මාසය තුළදී විනිමය අනුපාතය ස්ථාවරව පැවතීමත් සමඟ 2019 වසර තුළදී ශ්‍රී ලංකා රුපියල සියයට 0.6 කින් අතිප්‍රමාණය විය. තවද, 2020 වසරේ ජනවාරි මස 17 වැනි දින දක්වා කාලපරිච්ඡේදය තුළදී ශ්‍රී ලංකා රුපියල එ.ජ. ඩොලරයට සාපේක්ෂව සියයට 0.1 කින් අතිප්‍රමාණය විය. අනෙකුත් විදේශ ව්‍යවහාර මුදල්වල හැසිරීම පිළිබිඹු කරමින් 2020 ජනවාරි 17 දක්වා කාලපරිච්ඡේදය තුළදී ශ්‍රී ලංකා රුපියල අනෙකුත් බොහෝ ප්‍රධාන ව්‍යවහාර මුදල් ඒකකවලට සාපේක්ෂව අතිප්‍රමාණය විය.

**රූප සටහන 11: එ.ජ. ඩොලරයට සාපේක්ෂව රුපියලෙහි අගය**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**සංඛ්‍යා සටහන 4: තෝරාගත් ව්‍යවහාර මුදල් ඒකකවලට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලෙහි වෙනස්වීම**

| මුදල් ඒකකය | 2019 | 2020 (ජන. 17 දක්වා) අවප්‍රමාණය (-)/ අතිප්‍රමාණය (+) |
|---|---|---|
| එ.ජ. ඩොලරය | +0.6% | +0.1% |
| යුරෝ | +2.6% | +0.8% |
| ස්ටර්ලින් පවුම | -2.8% | +0.5% |
| ජපන් යෙන් | -1.0% | +1.6% |
| කැනේඩියානු ඩොලරය | -3.7% | +0.1% |
| ඕස්ට්‍රේලියානු ඩොලරය | +1.3% | +1.7% |
| ඉන්දියානු රුපියල | +2.6% | -0.3% |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව